සැ. යු. - 2017.04.28 වැනි දින පළ වූ අංක 2017 දරන ගැසට් පත්‍රයේ I : II (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,018 - 2017 මැයි මස 05 වැනි සිකුරාදා - 2017.05.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 826 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


සැ. යු. - පැනසෝමා ෆ්‍රෙන්ඩ්ෂිප් ෆවුන්ඩේෂන් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 අප්‍රේල් මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2017 මැයි මස 26 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 මැයි මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## මධ්‍යම පළාත් සභාවේ ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ - 3 සේවා ගණයෙහි ක්‍රීඩා නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම - 2017

මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරි III ශ්‍රේණියේ තනතුරෙහි පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා මධ්‍යම පළාත තුළ පදිංචි සුදුසුකම්ලත් ස්ත්‍රී / පුරුෂ දෙපාර්ශ්වයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *පොදු සුදුසුකම් :*

1.1. අයදුම්කරු ශ්‍රී ලාංකික විය යුතු ය.

1.2. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට (2017.05.30) පූර්වාසන්නයෙන් වූ වසර 03 ක කාලය තුළ මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.

1.3. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යකින් යුක්ත විය යුතු ය.

1.4. යම් ආගමක හෝ ආගමික නිකායක පැවිදිවරයක් දරන තැනැත්තෙක් නොවිය යුතු ය.

1.5. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ සේවය ස්ථිර කර ඇති අය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට සතුටුදායක සේවාවක් ඇති බවට ආයතන ප්‍රධානියාගේ සහතිකයකින් සනාථ කළ යුතු ය.

1.6. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට (2017.05.30) වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.

2. *අධ්‍යාපන සුදුසුකම් :* සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් 06 කින් අධ්‍යයන පොදු සහතිකපත්‍ර(සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

3. *වෘත්තීය සුදුසුකම් :*

3.1. ජාතික ක්‍රීඩා විද්‍යායතනය මගින් පවත්වනු ලබන වසරකට නොඅඩු ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා සමත්ව තිබීම.

*සමග*

3.2. ශ්‍රී ලංකාව නියෝජනය කරමින් පිළිගත් ජාත්‍යන්තර තරගාවලියකදී (ආසියානු ක්‍රීඩා තරග, ආසියානු ශූරතා තරග, පොදු රාජ්‍ය මණ්ඩලීය තරග, ලෝක ශූරතා තරග හෝ ඔලිම්පික්) 1, 2, 3 ස්ථානවලින් එකක් දිනා තිබීම.

*හෝ*

3.3. ක්‍රීඩා අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලේ යම් ඉසව්වකින් ජාතික මට්ටමින් 1, 2, 3 ස්ථාන ලබා තිබීම.

*හෝ*

3.4. ජාතික මහා ක්‍රීඩා උළෙලට අදාළව 3 වන අදියර වශයෙන් පැවැත්වෙන අන්තර් දිස්ත්‍රික් පළාත් තරගයන්හි දී කේවල තරගවලදී 1, 2, 3 ස්ථාන ලබා තිබීම.

*හෝ*

3.5. ජාතික මහා ක්‍රීඩා උළෙලට අදාළව 3 වන අදියර වශයෙන් පැවැත්වෙන අන්තර් දිස්ත්‍රික් පළාත් තරගයන්හි දී කණ්ඩායම් තරගවල ශූරතාවය ලබා තිබීම.

*හෝ*

3.6. ජාතික මහා ක්‍රීඩා උළෙලට අදාළව 2 වන අදියර වශයෙන් පැවැත්වෙන දිස්ත්‍රික් අන්තර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තරගයන්හිදී කේවල තරගවලදී 1,2,3 ස්ථාන ලබා තිබීම.

*හෝ*

3.7. ජාතික මහා ක්‍රීඩා උළෙලට අදාළව 2 වන අදියර වශයෙන් පැවැත්වෙන දිස්ත්‍රික් අන්තර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තරගයන්හි දී කණ්ඩායම් තරගවල ශූරතාවය ලබා තිබීම.

*හෝ*

3.8. ජාතික ක්‍රීඩා සංගම් මගින් පවත්වනු ලබන වාර්ෂික ජාතික විවෘත ශූරතා තරගයක 1, 2, 3 ස්ථාන ලබා තිබීම.

4. *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය. ශාරීරික යෝග්‍යතාවය පිරික්සීම සඳහා (පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව, ජාතික ක්‍රීඩා විද්‍යායතනය, ක්‍රීඩා වෛද්‍ය ඒකකය) විසින් පවත්වනු ලබන ශාරීරික යෝග්‍යතාව පිරික්සීමේ පරීක්ෂණයේදී ප්‍රතික්‍රියා වේගය, නම්‍යතාවය, උදරයේ ප්‍රතික්‍රියා වේගය, නම්‍යතාවය, උදරයේ ශක්තිය, දෙඅත්වල ශක්තිය, උලැගිතාවය, හිටි දුර පැනීම, වේගය හා දරාගැනීමේ හැකියාව යන ශාරීරික යෝග්‍යතාවයන් පරීක්ෂාවට ලක් කෙරේ. (කායික හා මානසික ආබාධ තත්වයෙන් නොවිය යුතු ය.)

සියලු අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් 2017.05.30 දිනට සම්පූර්ණ කර තිබිය යුතු ය.

5. *වැටුප් :*

5.1. වැටුප් ගෙවීම හා අනෙකුත් කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධාන පරිදි සිදු කරනු ලැබේ.
5.2. වැටුප් පරිමාණය :
රු. 29,840 - 10 x 300 - 11 x 350 - 10 x 560 -10 x 660 රු. 48,890/-
(MT 1 - 2016 වැටුප් කේතය අනුව)

6. *බඳවා ගැනීමේ කොන්දේසි :*

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති ක්‍රීඩා නිලධාරි තනතුරේ බඳවා ගැනීමේ පරිපාටිය අනුව බඳවා ගැනීමේ කොන්දේසි තීරණය වේ.

7. *බඳවා ගැනීමේ ක්‍රමය :*

7.1. මූලික සුදුසුකම් සපුරා ඇති සියලු අයදුම්කරුවන් විවෘත ලිඛිත විභාගයකට පෙනී සිටිය යුතුය. ලිඛිත විභාගයට පෙනී සිට සමත් වන සියලු අයැදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට සහභාගි විය යුතුය. ලිඛිත විභාගයේදී හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා සමස්ථ ලකුණු ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් ලකුණු ලබා ගන්නා අනුපිළිවෙළ අනුව ප්‍රමුඛතා ලේඛනයක් සකස් කෙරේ. ඒ අනුව ඉහළ ලකුණු ප්‍රමුඛතාවය අනුව පිරවිය යුතු ඇබෑර්තු ප්‍රමාණයට සමාන අයැදුම්කරුවන් ප්‍රමාණයකගේ කායික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා ප්‍රායෝගික පරීක්ෂණයකට යොමු කෙරේ. ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත් වූවන් පමණක් තනතුරු සඳහා බඳවා ගැනීම සිදු කෙරේ. ප්‍රායෝගික පරීක්ෂණයෙන් අසමත් වන අයැදුම්කරුවන් වෙනුවට ප්‍රමුඛතා ලේඛනයේ ඊළඟට ඉහළම ලකුණු ලබාගත් අයැදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයට යොමු කරනු ලබන අතර එයින් සමත් වන අයැදුම්කරුවන් පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනේ.

7.2. බඳවා ගැනීමේදී ප්‍රමුඛතාවය දක්වනු ලබන ක්‍රීඩා ක්ෂේත්‍ර :

1. වූෂු
2. බැඩ්මින්ටන්
3. තයිකොන්ඩෝ
4. බොක්සිං
5. කැරම්
6. කරාතේදෝ
7. චෙස්
8. පැසිපන්දු
9. තුන් ප්‍රයාමය
10. ජිම්නාස්ටික්
11. පාපැදි
12. රගර්
13. බර ඉසිලීම
14. මල්ලව පොර
15. මලල ක්‍රීඩා
16. කඹ ඇදීම
17. කාය වර්ධන
18. බීච් කබඩි
19. Hand Ball
20. වෙරළ වොලිබෝල් (Beach Volleyball)

8. *සේවා කොන්දේසි :*

8.1. මෙම තනතුර ස්ථිර ය, විශ්‍රාම වැටුප් සහිත ය.

8.2. අදාළ පත්වීම රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් නිකුත්කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අදාළ අනෙකුත් චක්‍රලේඛවල සඳහන් විධිවිධානවලට යටත් වේ.

8.3. මෙම තනතුරට පත්කිරීමෙන් අනතුරුව මධ්‍යම පළාත තුළ වසර 05 ක අවම වශයෙන් සේවා කාලයක් අනිවාර්යයෙන් සේවය කළ යුතු අතර එම කාලය තුළදී මධ්‍යම පළාතෙන් පිටතට ස්ථාන මාරු ලබා ගැනීමට හෝ වෙනත් තනතුරකට මුදාහැරීමට කරනු ලබන කිසිදු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ.

9. *අයැදුම් කිරීමේ ක්‍රමය :*

9.1. විභාග ගාස්තුව රු. 600/-කි. මෙම විභාග ගාස්තුව මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැරවන පරිදි මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ඒ සඳහා ලබාගත් ලදුපතක් අයැදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. එකී ලදුපත නොමැතිව එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර ගෙවන ලද විභාග ගාස්තු කිසිම හේතුවක් මත හෝ ආපසු ගෙවනු නොලබන බව ද සැලකිය යුතුය.

9.2. අයැදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කොට 2017.05.30 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ''ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයැදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයැදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ක්‍රීඩා නිලධාරී III ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම - 2017" යනුවෙන් සහ පදිංචි දිස්ත්‍රික්කය සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයැදුම්පත් හා අසම්පූර්ණ අයැදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී අස්ථානගත වන අයැදුම්පත් සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව වග කියනු නොලැබේ.

10. *විභාග මාධ්‍යය :*

විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අයැදුම්පත්‍රයේ තමන් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයට නියමිත අක්ෂරය පැහැදිලිව සඳහන් කළ යුතු අතර එය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

11. *විභාග මධ්‍යස්ථානය :*

විභාග මධ්‍යස්ථානය පිළිබඳව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අයැදුම්කරුවන්ට විභාග ප්‍රවේශ පත්‍රය මගින් දැනුම් දෙනු ලැබේ.

12. විභාග විෂය නිර්දේශය :

1. අභියෝග්‍යතාවය :

කාලය පැය 01 යි. (ලකුණු 100) මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයාගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම, භාෂාව හා රචනය, දෙන ලද ලිපියක් කෙටුම්පත් කිරීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්ථාර, වගු සකස් කිරීම, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කීපයක අදහස තනි වාක්‍යයකින් ලිවීම, තර්කන ශක්තිය, ගැටළු නිරාකරණය, තීරණ ගැනීමේ හැකියාව ඇතුලු සාමාන්‍ය බුද්ධිය මැන බැලෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත ය.

2. සාමාන්‍ය දැනුම :

කාලය පැය 01 යි. (ලකුණු 100) මෙම ප්‍රශ්න පත්‍රය මගින් ශ්‍රී ලංකාවේ ඓතිහාසික, භූගෝලීය, සමාජයීය හා ආර්ථික වශයෙන් වැදගත්වන තොරතුරු හා දේශීය හා විදේශීය ක්‍රීඩා ක්ෂේත්‍රවලට අදාළ කාලීන තොරතුරු පිළිබඳ අයැදුම්කරුවන්ගේ සාමාන්‍ය දැනුම මැන බැලේ.

13. අයැදුම්පත් පිරවීම සඳහා උපදෙස් :

ආදර්ශ අයැදුම්පත් ආකෘතියට ප්‍රකාර ඒ 4 ප්‍රමාණයක කඩදාසිය දෙපැත්තම භාවිතා කරමින් එහි පළමු පිටුවෙහි අංක 1-5 දක්වා කරුණු ද අනෙක් පිටුවල ඉතිරි ඡේදද ඇතුළත්වන සේ සකස් කර ගත යුතුය. අයැදුම්පත්‍රය යතුරු ලියනය

කර ගැනීමෙන් හෝ පැහැදිලි අත් අකුරින් සකස් කර ගත යුතුය. අයැදුම්පත්‍රය පිරවීමේදී පහත දැක්වෙන සංකේත අංක නියමිත කොටුවල පැහැදිලිව සඳහන් කළ යුතු ය.

13.1. අයැදුම් කරන දිස්ත්‍රික්කය ලෙස සඳහන් කල යුත්තේ අයැදුම්කරුගේ ස්ථිර පදිංචිය ඇති දිස්ත්‍රික්කයට අදාළ සංකේත අංකයයි.

| | | |
|---|---|---|
| මහනුවර | - | 01 |
| මාතලේ | - | 02 |
| නුවරඑළිය | - | 03 |

13.2. අයැදුම් කරනු ලබන ක්‍රීඩා ක්ෂේත්‍ර (දැන්වීමෙහි 7.2 හි සඳහන් කේත අංක භාවිතා කරන්න)

13.3. අයැදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ රු. 2,40,360/- කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

13.4. යම් අයැදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව පත්වීම් ලැබීමට පෙර හෝ පත්වීම් ලබා දීමෙන් පසු හෝ ඕනෑම අවස්ථාවකදී අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය හෝ පත්වීම අවලංගු කෙරෙනු ඇත. එසේම දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත්කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

13.5. රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයැදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

14. මෙම විභාග පැවැත්වීම පිළිබඳව හෝ පැවැත්වීමෙන් පසුව තෝරා ගැනීම් කිරීම / නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව අවසාන තීරණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එසේම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම / තීරණය කිරීම, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

ආර්.එම්.එන්. රත්නායක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත් සභාව.

2017 අප්‍රේල් මස 06 වැනි දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.

**ආදර්ශ අයැදුම්පත්‍රය**

මධ්‍යම පළාත් සභාවේ ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 3 සේවා ගණයෙහි ක්‍රීඩා නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම - 2017

විභාග අංකය : [ ]

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :- [ ] ( සිංහල S, දෙමළ - T, ඉංග්‍රීසි - E )
(අදාළ සංකේතය කොටුව තුළ ලියන්න)

අයැදුම් කරනු ලබන ක්‍රීඩා ක්ෂේත්‍ර :- [ ]

පදිංචි දිස්ත්‍රික්කය :- [ ]

දිස්ත්‍රික්කයට අදාළ සංකේත අංකය :- [ ]

1. 1.1 මුලකුරු සමඟ නම : ..........................................................................
Mr/Mrs/Miss (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.2 මුලකුරු සමග නම : ..........................................................................
මයා/මිය/මෙනවිය (සිංහලෙන්/දෙමළෙන්)

1.3 මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................................................................

1.4 මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්/දෙමළෙන්) :..........................................................................................

02. ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :..........................................................................................

2.1 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :..........................................................................................
..........................................................................................

2.2 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................................................................

2.3 දැනට රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම් කාර්යාලයීය ලිපිනය :..........................................................................................
..........................................................................................

2.4 දුරකතන අංකය :..........................................................................................

03. උපන් දිනය :..........................................................................................

3.1 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට (2017.05.30) වයස : අවු. :................ මාස :.............. දින :................

3.2 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

04. ස්ත්‍රී/පුරුෂ භාවය :...........................................

05. අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :..........................................................................................

| **ඡන්ද හිමි නාම ලේඛනයට අනුව පදිංචිය** | **2014** | **2015** | **2016** |
|---|---|---|---|
| මැතිවරණ කොට්ඨාසය | | | |
| ඡන්ද ප්‍රදේශය | | | |
| ඡන්ද කොට්ඨාසය | | | |
| ග්‍රාම නිලධාරි කොට්ඨාස අංකය | | | |
| ගෘහ අංකය | | | |
| නමට ඉදිරියෙන් ඇති පිළිවෙල අංකය | | | |

06. *අධ්‍යාපන සුදුසුකම් :*

6.1 අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය :

වර්ෂය :..................................... විභාග අංකය :..................................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

07. *වෘත්තීය සුදුසුකම් ඃ*

7.1 ක්‍රීඩා ඩිප්ලෝමාව ඃ

| *ආයතනය* | *හදාරා ඇති ඩිප්ලෝමා පාඨමාලාව* | *කාල සීමාව* | *සාමාර්ථය* | *සහතිකපත් අංකය හා දිනය* |
|---|---|---|---|---|
| | | | | |

7.2 ක්‍රීඩා කුසලතාවයන් (දැන්වීමෙහි 3.2 සිට 3.8 දක්වා වන ක්‍රීඩා ජයග්‍රහණ)

7.2.1 ..................................................

7.2.2 ..................................................

7.2.3 ..................................................

7.2.4 ..................................................

7.2.5 ..................................................

7.2.6 ..................................................

7.2.7 ..................................................

7.2.8 ..................................................

7.2.9 ..................................................

7.2.10 ..................................................

08. *වෙනත් සුදුසුකම් ඃ*..................................................

09. *විභාග ගාස්තු ගෙවීම පිළිබඳ තොරතුරු ඃ*

9.1 විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම ඃ........................................
9.2 දිනය ඃ........................................
9.3 කුවිතාන්සි අංකය ඃ........................................

(මුදල් ගෙවා ලබාගත් ලදුපත මෙම තීරුව අසලින් අලවන්න.)

**අයදුම්කරුගේ ප්‍රකාශය**

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු වන බවත්, පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මා දනිමි.

..............................
දිනය

..............................
අයදුම්කරුගේ අත්සන.

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .......................................................................... මහතා/මහත්මිය/මෙනවිය මම පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය අද දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

දිනය :................................

....................................................
සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන්නාගේ සම්පූර්ණ නම :-.......................................................................................................................................
තනතුර :-..............................................................................................................................................................................
ලිපිනය :-.............................................................................................................................................................................

10. රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයෙහි නියුතු අයදුම්කරුවකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කළ යුතු ය.

මෙම ඉල්ලුම්කරු වන ................................................................................................................... මහතා/මහත්මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ......................................................................................... වශයෙන් සේවය කරයි. පසුගිය වසර 05 තුළ ඔහු/ඇය මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව සහ ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා මුදා හැරිය හැකි බවත් සහතික කරමි.

.................................................................................
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව සහිතව)

දිනය :......................................

05-07

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
# සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

## * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2017** | | | |
| මැයි | 2017.05.05 | සිකුරාදා | 2017.04.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.05.12 | සිකුරාදා | 2017.04.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.05.19 | සිකුරාදා | 2017.05.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.05.26 | සිකුරාදා | 2017.05.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජුනි | 2017.06.02 | සිකුරාදා | 2017.05.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.06.09 | සිකුරාදා | 2017.05.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.06.16 | සිකුරාදා | 2017.06.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.06.23 | සිකුරාදා | 2017.06.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.06.30 | සිකුරාදා | 2017.06.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2017.07.07 | සිකුරාදා | 2017.06.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.07.14 | සිකුරාදා | 2017.06.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.07.21 | සිකුරාදා | 2017.07.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.07.28 | සිකුරාදා | 2017.07.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.).*

2017 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.